**ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2014**

---

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහනේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල අතර 2010 පෙබරවාරි 23 දින එළඹි අංක 797-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ජාතික කෘෂි ව්‍යාපාරය සංවර්ධනය කිරීමේ වැඩසටහනේ මූල්‍ය ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩසටහනේ ප්‍රධාන නියෝජිතායතනය වූ අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ථ වගකීම දැරිය යුතු විය. කෙසේ වුවද කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලෙහි 2013 ජනවාරියේදී මධ්‍ය කාලීන දූත සමාලෝචනයෙන් පසු කරන ලද නිර්දේශයන්ට අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය 2013 මැයි සිට වැඩසටහනේ ප්‍රධාන නියෝජිතායතනය වන අතර දැනට ක්‍රියාත්මක වන "දිවි නැඟුම" වැඩසටහන සමඟ සම්බන්ධවීම මඟින් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ථ වගකීම දැරිය යුතු විය. වර්තමානයේදී මෙම අංශයේ ක්‍රියාකාරකම් ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත මාරු කර තිබුණි. (1) වෙළඳ පල දාමය සංවර්ධනය සහ ගොවිපළේ අය කරන මිල, ගොවිපළේ පලදාව සහ පෙරසැරි ගොවි නිෂ්පාදන වලට වටිනාකම එකතු කිරීම වැනි සම්බන්ධතා සංරචක වලට සහභාගී කරවීම හරහා ඔවුන්ගේ ආදායම් වැඩිකිරීම සහ (2) දියුණු සහ වැඩි ප්‍රමාණයක රැකියා අවස්ථා ඔවුන් වෙත පිරිනැමීමට ඉඩම් අහිමි තරුණයන්ට මූල්‍ය සහ පුහුණු ප්‍රතිපාදන වෙන් කිරීම මඟින් සුළු ඉඩම් හිමි ගොවීන් හා ඉඩම් නොමැති විශේෂයෙන් තරුණයින්ට සහය වීම වැඩසටහනේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 4,309.52 කට සමාන එ.ජ.ඩො. මිලියන 32.9 ක් වන අතර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල විසින් ඉන් රු.මිලියන 3,268.75 කට සමාන එ.ජ.ඩො. මිලියන 25 ක් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇති අතර ඉතිරි අරමුදල් ශ්‍රී ලංකා රජය, පුද්ගලික සමාගම්, නිෂ්පාදකයින්, ප්‍රජා මූල සංවිධාන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දායක වීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 01 ආරම්භ කළ අතර 2016 මාර්තු අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීමද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2015 මාර්තු 31 හෝ ඊට පෙර වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කළ යුතු වුවත් 2015 මැයි 21 දින එය විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

වැඩසටහනේ, වටිනාකම් දාම සංවර්ධනය සහ වෙළඳ පළ සම්බන්ධතා සංරචකය යටතේ වැය කළ රු. මිලියන 3.39 ක් මූල්‍ය ප්‍රකාශන වල සිවිල් වැඩ යටතේ දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු ශේෂ

වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණය මුදල් ලැබීම් වලින් සිදු කළ රු. මිලියන 25.71 ක් වූ වැඩසටහනේ මුළු වියදම, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික විසර්ජන ගිණුමේ දක්වා ඇති මුළු වියදම රු. මිලියන 32.36 සමඟ නොගැලපුණි. කෙසේ වෙතත් වෙනස සැසඳීමට ක්‍රියාකර නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2014 සඳහා වාර්ෂික වැඩ සැලැස්මේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො . මිලියන | රු.මිලියන |
| කෘ.සං.ජා.අ | 25.00 | 3,268.75 | 1,500.00 | 0.19 | 25.71 | 1.348 | 176.15 |
| පුද්ගලික සමාගම් | 5.25 | 686.44 | - | - | - | - | - |
| ප්‍ර.මූ.සං. | 0.76 | 99.37 | - | - | - | - | - |
| ස.මූ.ආ. | 0.39 | 50.99 | - | - | - | - | - |
| නිෂ්පාදකයින් | 0.57 | 74.53 | - | - | - | - | - |
| ශ්‍රී.ලං.ර | 0.99 | 129.44 | 71.17 | - | 2.95 | - | 12.96 |
| එකතුව | 32.96 | 4,309.52 | 1,571.17 | 0.19 | 28.66 | 1.348 | 189.11 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා වාර්ෂික වැඩ සැලැස්මේ රු.මිලියන 1,571.17 ක ප්‍රතිපාදනයක් සිදු කළ ද සමාලෝචිත වර්ෂය තුළ දී මුළු ප්‍රතිපාදනයෙන් රු. මිලියන 28.6 ක් එනම් සියයට 1.82 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින්, වාර්ෂික වැඩ සැලැස්ම නිසියාකාරව ක්‍රියාත්මක කර නොමැති බව පැහැදිලි විය.

(ආ) මූල්‍ය ගිවිසුම අනුව,මුළු ප්‍රතිපාදනයෙන් සියයට 21.14 ක් නියෝජනය වන පරිදි එ.ජ.ඩො. මිලියන 6.97 ක්, වටිනාකම් දාම සංවර්ධන ක්‍රියාකාරකම් වල නියුතු පුද්ගලික සමාගම්, නිෂ්පාදකයින්, ප්‍රජා මූල සංවිධාන, සහභාගීත්ව මූල්‍ය ආයතන දායක වීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් අදාල පාර්ශවයන් මුළුමනින්ම දායකත්වය සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) වැඩසටහනේ ක්‍රියාකාරකම් 2016 මාර්තු 31 වන විට අවසන් කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත්, 2014 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් කාලය සියයට 80 ක් අවසන් වී තිබුණද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 4.38 ක් පමණක් වැඩසටහන විසින් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

පුද්ගලික අංශය සහ ප්‍රජා මූල්‍ය සංවිධාන, අලෙවි දාම සංවර්ධනය හා සම්බන්ධතා, කැඳවා පුහුණු කිරීමත් වැඩසටහන් කළමනාකරණයත්, ප්‍රතිපත්ති උපකාර ආදියත් ප්‍රතිව්‍යුහනය කිරීම ආදී සංරචක යටතේ වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) ඉහත දක්වන ලද සංරචක යටතේ සියළුම ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් කරන ලද පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතටත් වර්තමානයේ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙතටත් නිරන්තර වෙනස්වීම වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීමට දැඩි ලෙස බලපා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වැඩසටහන් අධ්‍යක්ෂ හා කෘෂිව්‍යාපාර විශේෂඥයින් ඇතුළු වැඩසටහනේ ප්‍රධාන පුද්ගලයින් මෙන්ම වැඩසටහන් කාර්යාලයේ පිහිටීම වරින් වර වෙනස් වී තිබුණි. තවද ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වෙනස්වීම් හේතුවෙන් වැඩසටහනේ සමස්ථ කාලය ආවරණය වන පරිදි විස්තීරණ වැඩ සැලැස්ම සමඟ විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොතිබුණු අතර වැඩසටහනේ අඛණ්ඩ මෙහෙයුමට එය තවදුරටත් බලපා තිබුණි.

(ආ) වැඩසටහනේ ප්‍රගති වාර්තා අනුව, වැඩසටහනේ වටිනාකම් සංවර්ධන දාම සහ වෙළඳපළ සම්බන්ධතා සංරචකය යටතේ පුද්ගලික අංශයේ සංවිධාන වලින් ලද ව්‍යාපාර යෝජනා 02 ක් අනුමත කර තිබුණු අතර කිලිනොච්චියේ එළවළු වගා කිරීම හා වැලිමඩ හා ඌව පරණගම ප්‍රදේශ වල මී පැණි සංවර්ධනය කිරීම වැනි යෝජනා ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 3.39 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් මී පැණි සංවර්ධන කටයුතු වලට සම්බන්ධ පුද්ගලික ආයතනයකට ලබා දුන් රු. මිලියන 2.0 ක් එය අදාල කාර්යයට භාවිතා නොකර 2014 දෙසැම්බර් 31 දිනට විශේෂ ගිණුමක තැන්පත් කර තිබුණි.

## 3.3 මූල්‍ය පාලනයේ අඩු පාඩු

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, වැඩසටහනේ ක්ෂුද්‍ර මූල්‍ය සංරචකය 2014 ජනවාරි සිට නතර කර තිබුණු අතර ප්‍රදේශීය සංවර්ධන බැංකුව විසින් දෙන ලද ක්ෂුද්‍ර මූල්‍ය ණය අය කර ගැනීම් එකතුව රු. මිලියන 49.6 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණු අතර එය 2014 දෙසැම්බර් 31 දිනට වෙනම ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ආ) වැඩසටහන් සැලැසුම් වාර්තාවේ දක්වා ඇති සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වැඩ සැලැස්ම හා අයවැය එක් එක් සංරචක යටතේ සකස් කර තිබුණු අතර පිරිවැය වර්ගීකරණ වෙනස්කම් හේතුවෙන් වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සත්‍ය පිරිවැය අයවැය අගයන් සමඟ පහසුවෙන් සැසඳිය නොහැකි විය.

(ඇ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව අදාල වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීමට ගෘහ භාණ්ඩ හා උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.